# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2016

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

---

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

A - කොටස අනිවාර්ය ප්‍රශ්න 8 කි. මේ සඳහා මුළු ලකුණු 20 කි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සම්බන්ධ දැනුමත්, තනි පුද්ගල ව්‍යාපාර පිළිබඳ දැනුමත්, වැටුප් ලේඛන පිළිබඳ දැනුමත්, හවුල් ව්‍යාපාර ආඥා පනත පිළිබඳ අවබෝධයත්, සීමිත සමාගම් සම්බන්ධ අවබෝධය සහ තොග ඇගයීම ආශ්‍රිත දැනුමත් විමසා බැලීමට වාස්තවික ප්‍රශ්න 8 ක් යොමුකර තිබුණි.

ලකුණු 20 ම ලබා ගැනීමට සමත් වූයේ අයදුම්කරුවන්ගෙන් අතලොස්සක් පමණි. 1.5 ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වැඩි දෙනෙක් සපයා නොතිබුණි. හවුල් ව්‍යාපාරයක කීර්ති නාමය අගය කිරීමේ ක්‍රම වෙනුවට අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් කීර්තිනාමය පොත්වල සටහන් තැබීමේ ක්‍රම දක්වා තිබුණි. විෂය නිර්දේශයට අනුකූලව දැනුම වර්ධනය කිරීමෙන් හා ස්ව-අධ්‍යයන පාඩම් මාලා පොත් පරිශීලනය කිරීමෙන් අයදුම්කරුවන් විසින් තම දැනුම තහවුරු කරගත යුතු වේ.

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

ගලපන ලද මුදල් පොත සහ බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කරන ලෙස යොමු වූන මෙම ප්‍රශ්නයට ලකුණු 5 ක් වෙන්කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් මුළු ලකුණු ලබාගත් ප්‍රශ්නය මෙය වේ. කෙසේවෙතත්, ඇතැම් අයදුම්කරුවන් ගලපන ලද මුදල් පොතට අදාල සටහන් හඳුනා නොගැනීම නිසා වෙන්කළ ලකුණු ලබා ගත නොහැකි විය. ඇතැම් අයදුම්කරුවන් බැංකුවෙන් සිදුවූ වරද ද මුදල් පොතට ගලපා තිබුණි.

මුදල් පොතේ ශේෂය සොයා නිවැරදි ශේෂය බැංකු සැසඳුමට ගෙන ඒම අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් මගහැර තිබුණි. මුදල් පොතට සටහන් විය යුතු ගැලපීම් ද බැංකු සැසඳුම් ප්‍රකාශය තුළ දක්වා තිබුණි. මූලික න්‍යායික දැනුම තහවුරු කරගෙන නොමැති බව අයදුම්කරුවන් බහුතරයකගේ උත්තර වලින් තහවුරු විය. කෙසේවුවත්, මුළු ලකුණු 5 ම ලබාගත් අයදුම්කරුවන් සංඛ්‍යාව ඉහළ මට්ටමක විය.

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම පිළියෙල කිරීම පිළිබඳව විමසා තිබුණි. අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් මුළු ලකුණු ලබාගැනීමට සමත් විය. කෙසේවෙතත්, අතලොස්සක් අයදුම්කරුවන් අවබෝධයකින් තොරව සටහන් නිවැරදිව හඳුනා නොගැනීම නිසා පාලන ගිණුම් මාරු කර සටහන් දක්වා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් පාලන ගිණුම්වල ආරම්භක ශේෂයන් දක්වා නොතිබුණි. එසේම ගනුදෙනු සටහන් හර සහ බැර වශයෙන් නිවැරදිව හඳුනා නොගෙන පාලන ගිණුම් වලට සටහන් කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

## ප්‍රශ්න අංක 04

හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය සටහන් කිරීමට අදාල මෙම ප්‍රශ්නය ඉතා සරලය. මෙම ප්‍රශ්නයෙන් හවුල්කරුවන් අතර, ලාභා'ලාභ බෙදාගන්නා අනුපාතය වෙනස් කරගන්නා අවස්ථාවක කීර්තිනාමය ගැලපීමට අදාල සටහන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම විමසීම බලාපොරොත්තු විය. කීර්තිනාමයේ වටිනාකම පොත්වල වාර්තා කිරීම සඳහා අදාල ජර්නල් සටහන් වැඩිදෙනෙක් නිවැරදිව තබා තිබුණද, කීර්තිනාමය ලියාහැරීම වාර්තා කිරීම සඳහා නිවැරදිව ජර්නල් සටහන් තබා නොතිබුණි. ඇතමෙක් කීර්තිනාමය ලියාහැරීමට අදාලව කිසිදු සටහනක් තබා නොමැති බව ද දක්නට ලැබුණි. ප්‍රශ්නය කියවා නිවැරදිව අවබෝධ කර නොගෙන පිළිතුරු සැපයූ ඇතැම් අයදුම්කරුවන් අදාල ලෙජර් ගිණුම් පෙන්වා ජර්නල් සටහන් නොතැබූ අවස්ථා ද විය. න්‍යායාත්මක දැනුම අඩුකම නිසා ජංගම ගිණුමේ කීර්තිනාම ගැලපීම සිදුකළ අවස්ථාද දක්නට විය. කීර්තිනාම ගිණුමට අදාල සටහන් නිවැරදිව පෙන්වා ඇතත් ප්‍රාග්ධන ගිණුම් වලට අදාල සටහන් නිවැරදිව නොපෙන්වීම නිසා ඇතැම් අයදුම්කරුවන්ට ලකුණු ලබා ගත නොහැකි විය. පොදුවේ ගත්කළ මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු ලබා ගැනීමට බහුතරයකට හැකි විය.

## ප්‍රශ්න අංක 05

ලාභ අපේක්ෂාවෙන් තොරව පවත්වාගෙන යනු ලබන සමිති සමාගම් ගිණුම් සම්බන්ධයෙන් යොමුකර තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ලබාගත් ලකුණු මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කළ යුතු දායක මුදල් හා වැටුප් නිවැරදිව හඳුනා ගැනීමට අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සමත් වී නොතිබුණි. උපචිත වියදම් හා කලින් ලැබීම් ආදිය අදාල ආදායම්, වියදම් ගිණුම් වලට ගලපනවා වෙනුවට ලැබීම් හා ගෙවීම් ගිණුමට සටහන් කරමින් න්‍යායාත්මක වැරදි සිදුකළ අයදුම්කරුවන් ද දක්නට විය.

ප්‍රශ්නය කියවා අවබෝධ කර නොගෙන පිළිතුරු සැපයීම මූලික දුර්වලතාවය විය.

## ප්‍රශ්න අංක 06

ස්ථාවර වත්කම් විකිණීමකට අදාලව ජර්නල් සටහන් පිළියෙල කිරීම පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදී. ජර්නල් සටහන් පෙන්වා ලබාගත යුතු ලකුණු 5 බොහෝ අයදුම්කරුවන්ට අහිමි වූයේ ජර්නල් සටහන් ලිවීමේදී දැක්වූ දුර්වලතාවයන් හේතුවෙනි. වත්කම් විකිණීමට අදාල ලාභය සහ ක්ෂය නිවැරදිව ගණනය කර ඇතත් ගනුදෙනු වාර්තා කිරීමට අදාල ජර්නල් සටහන් දැක්වීමට ඇතැම් අයදුම්කරුවන් අසමත් විය. එසේම ජර්නල් සටහන් නිවැරදිව දැක්වුවද සංලක්ෂ්‍යයන් දක්වා නොමැති උත්තර පත්‍ර ද විය. ලෙජර් ගිණුම් පිළියෙල කළ අයදුම්කරුවන් පවා සිටියද ඔවුන්ට ලකුණු අහිමි විය. මෝටර් රථය විකිණීමේදී ඉවත් කළ යුතු ක්ෂය වටිනාකම ගණනය කර ක්ෂය වෙන්කිරීමේ ගිණුමෙන් එම ප්‍රමාණය ඉවත් කිරීම ඇතැම් අයදුම්කරුවන් විසින් සිදු කර නොතිබුණි. මිලදීගත් වාහනය ණයට මිලදී ගත් ලෙස සටහන් නොතබා මුදල් පොතේ වරදවා සටහන් කළ අවස්ථා ද දක්නට විය. මෝටර් රථ ඉවත් කිරීමේ ගිණුමට කළ යුතු ගැලපුම් මෝටර් රථ ගිණුමට ගලපා සටහන් තැබීම මූලික සිද්ධාන්තමය වැරුද්දකි. ක්ෂය ගණනය කිරීමේදී මිලදී ගත් දිනය, ඉවත් කළ දිනය නොසලකා වර්ෂයටම අදාල වන සේ ගණනය කළ අයදුම්කරුවන් ද විය. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් සතුටුදායක පිළිතුරු ඉතාමත් අඩු මට්ටමක පැවතුණි.

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම් තීරු ක්‍රමයට පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත. මුළු ලකුණු ලබා ගැනීමට හැකි වූයේ ඉතාමත් සීමිත අයදුම්කරුවන් පිරිසකට පමණි. බහුතරයක් අයදුම්කරුවන් විශ්‍රාම ගත් හවුල්කරුගේ කොටස ප්‍රාග්ධන ගිණුමට මාරු කර නිවැරදිව ගලපා නොතිබුණි. එසේම, ප්‍රත්‍යාගණන ලාභයද නිවැරදිව ගණනය කොට හවුල්කරුවන් අතර නිවැරදිව බෙදාහැරීම ද සිදුකර තිබුණේ අයදුම්කරුවන්ගෙන් අතලොස්සක් පමණි. කීර්තිනාමය පිළිබඳ ගැලපුම බොහෝ අයදුම්කරුවන් විසින් නිවැරදිව සටහන් කර තිබුණද අනවබෝධය හේතුවෙන් සමහරක් අයදුම්කරුවන් කීර්තිනාමය ජංගම ගිණුමේද සටහන් කර තිබුණි. එසේම, ප්‍රත්‍යාගණන ලාභය ද ජංගම ගිණුමේ සටහන් කළ අවස්ථා දක්නට ලැබුණි.

සමස්ථයක් වශයෙන් ගත් කල මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය එතරම් සතුටුදායක මට්ටමක නොපැවතුණි. අයදුම්කරුවන් විසින් හවුල් ව්‍යාපාර ආශ්‍රිත ප්‍රත්‍යාගණනයන්, විශ්‍රාම ගැනීම් ආදිය ඇතුලත් ගැටළු තනිව විසඳා විභාග ප්‍රශ්න වලට සාර්ථකව මුහුණ දීමට සූදානම් විය යුතුය.

### ප්‍රශ්න අංක 08

ක්‍රීඩා සමාජයක ආදායම් සහ වියදම් ගිණුම පිළියෙල කිරීමත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමත් පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. දී තිබූ ලැබීම් සහ ගෙවීම් ගිණුමේ තොරතුරුත් අනෙකුත් තොරතුරුත් යොදාගෙන ආදායම් සහ වියදම් ගිණුමට ගතයුතු ශේෂයන් තීරණය කළ යුතු නමුත් ඇතැම් අයදුම්කරුවන් ලැබීම් හා ගෙවීම් ගිණුමේ තොරතුරු කිසිදු ගැලපුමකින් තොරව ආදායම් හා වියදම් ගිණුමට මාරුකර තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් සාමාජික මුදල් ආදායම නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් විය. එසේම බහුතරයක් අයදුම්කරුවන් පෙරවැඩ පැහැදිලිව පෙන්වා නොතිබුණි.

සමස්ථයක් වශයෙන් ගත්කල මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය එතරම් සතුටුදායක නොවීය.

### ප්‍රශ්න අංක 09

අසම්පූර්ණ සටහන් ආශ්‍රයෙන් කේවල ස්වාමි ව්‍යාපාරයක ශේෂ පිරික්සුම පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු ලබා ගැනීමට හැකිවූයේ අයදුම්කරුවන්ගෙන් ඉතාමත් සුළු පිරිසකට පමණි. ඊට හේතු වශයෙන්, ප්‍රශ්නයේ අවශ්‍යතාව අවබෝධ කර නොගෙන ශේෂ පත්‍රය පිළියෙල කිරීම, පෙරවැඩ නොපෙන්වීම, ආදිය දැක්විය හැකිය. අතලොස්සක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට ඉදිරිපත්ව නොතිබුණි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පෙරවැඩ වශයෙන් මුදල්පොත පිළියෙල කර අවශ්‍ය අගයන් ලබාගත යුතු වුවද එලෙස ප්‍රශ්නයට ප්‍රවිශ්ඨ වී තිබුණේ අයදුම්කරුවන්ගෙන් අතලොස්සක් පමණි. එසේම, ආරම්භක හා අවසාන ශේෂයන් නිවැරදිව ගලපා ප්‍රාග්ධන ශේෂය ලබාගත යුතු වුවද බහුතරයක් අයදුම්කරුවන් එය නිවැරදිව සිදුකර නොතිබුණි.

සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය අසතුටුදායක මට්ටමක පැවතුණි.

# D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

සීමාසහිත පෞද්ගලික සමාගමක විස්තීර්ණ ආදායම් ප්‍රකාශයත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයත් පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි. නියමිත ආකෘති යොදාගෙන පිළිතුරු සැපයීමට බොහොමයක් අයදුම්කරුවන් උත්සාහා කර තිබූ අතර එය ඉතාමත් හොඳ ප්‍රවණතාවයකි. සාර්ථක අයුරින් ලකුණු ලබා ගැනීමට බහුතරයක් අයදුම්කරුවන් සමර්ථ විය.

පරිපාලන වියදම් යටතට ගැනෙන අයිතමයන් හඳුනාගැනීමට බොහෝ අයදුම්කරුවන් අසමත්ව ඇත. කෙසේවෙතත්, පෙරවැඩ ලෙස ඒවා පෙන් වූ අයදුම්කරුවන් නියමිත ලකුණු රැස්කර ගැනීමට සමත් විය. ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ මූලික දැනුම නොමැතිවීම අයදුම්කරුවන්ගේ පොදු දුර්වලතාවයක් ලෙස දැක්විය හැකිය. ආදායම් බදු ගැලපුම නිවැරදිව සටහන් කර තිබුණේ ඉතාමත් සුළු පිරිසකි. උපචිත වියදම් පිළිබඳ ගැලපුම් විසඳීමේදී හර සහ බැර සටහන් පිළිබඳ මූලික අවබෝධය බොහොමයක් අයදුම්කරුවන්ට නොමැති බව අනාවරණය විය. ඇතැම් අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අදාල සටහන් හා ආදායම් ප්‍රකාශයට අදාල සටහන් පටලවාගෙන තිබුණි. අයදුම්කරුවන් විසින් අදාල ගැලපුම් නිසි ආකෘතියට අනුකූලව නිවැරදිව දැක්වීමට අවබෝධය ලබාගත යුතුය. පෙරවැඩ නිවැරදිව සිදුකර ආදායම් ප්‍රකාශයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අදාල අගය නිසි පරිදි පෙන් වූ අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් විය. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ඉල්ලා නැතත් සමහර අයදුම්කරුවන් එයද ඉදිරිපත් කිරීමට පෙලඹීමෙන් කාලය අපතේ යවා ඇති අතර ඉන් පෙනී යන්නේ ප්‍රශ්නය කියවා අවබෝධ කර නොගෙන උත්තර සපයා ඇති බවය. කාල කළමනාකරණය සැලකිල්ලට ගෙන අවශ්‍ය හෝ ඉල්ලා ඇති තොරතුරු පමණක් ලබා දීම වැඩි ලකුණු රැස්කර ගැනීමට හේතු වේ.

තවදුරටත් මූලික ගිණුම්කරණ මූලධර්ම, නව ගිණුම්කරණ ප්‍රමිත, නව සමාගම් පනත පිළිබඳව අවබෝධය ලබා ගත යුතුය. ප්‍රශ්න වලට උත්තර ලිවීමේදී පිටු වෙන්කර, ප්‍රශ්න අංක නිවැරදිව යෙදීම, උත්තර ආසන්නයෙන්ම අදාල පෙරවැඩ පෙන්වීම සහ ප්‍රශ්නයේ කොටස් තැනින් තැන වෙනත් පිටුවල පෙන්වීමෙන් වැළකීම මඟින් ප්‍රශ්නයට හිමි ලකුණු සියල්ලම ලබා ගැනීමට හැකිවනු ඇත.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා සැලකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කාලයක් දෙනු ලැබේ).

(3) අයදුම්කරුවන් ප්‍රවේශමෙන් ප්‍රශ්නය කිප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සැම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සහතික විය යුතුය.

(8) ස්වඅධ්‍යයන පාඩම්මාලා පොත්, ලිපි සඟරා ආදිය කියවිය යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පෙර ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

\- * * * -